සැබැවින්ම අල්ලාහ් ගැත්තෙකුට ආදරය කරන්නේ නම්, ඔහු ජිබ්රීල් අමතා මෙසේ පවසයි: 'සැබැවින්ම, මම පුද්ගලයකුට ආදරය කරමි. එබැවින් ඔබ ද ඔහුට ආදරය කරන්න.' එවිට, ජිබ්රීල් ඔහුට ආදරය කරයි

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "සැබැවින්ම අල්ලාහ් ගැත්තෙකුට ආදරය කරන්නේ නම්, ඔහු ජිබ්රීල් අමතා මෙසේ පවසයි: 'සැබැවින්ම, මම පුද්ගලයකුට ආදරය කරමි. එබැවින් ඔබ ද ඔහුට ආදරය කරන්න.' එවිට, ජිබ්රීල් ඔහුට ආදරය කරයි. පසුව අහස් වැසියන්ට ද මෙසේ නිවේදනය කර සිටියි: 'සැබවින්ම, අල්ලාහ් පුද්ගලයකුට ආදරය කර ඇත; එබැවින් ඔබ ද ඔහුට ආදරය කරන්න;' එවිට අහස් වාසීහු (දේවදූතයන්) ආදරය කරති. පසුව පොළොවේ පිළිගැනීම ඔහුට නියම කරනු ඇත. අල්ලාහ් ගැත්තෙකුට වෛර කරන්නේ නම්, ඔහු ජිබ්රීල් අමතා මෙසේ කියයි: 'මම පුද්ගලයකුට වෛර කරමි, ඔබ ද ඔහුට වෛර කරන්න.' ඒ අනුව ජිබ්රීල් ද ඔහුට
වෛර කරනු ඇත. පසුව ජිබ්රීල් අහස් වාසීන් අමතා මෙසේ නිවේදනය කරයි: 'සැබැවින්ම
අල්ලාහ් පුද්ගලයකුට වෛර කර ඇත. ඒ නිසා ඔබ ද ඔහුට වෛර කරන්න.' එවිට ඔවුහු ද ඔහුට වෛර
කරති. එවිට පොළොවෙහි වෛරය ඔහුට නියම වනු ඇත." [صحيح] [صحيح مسلم]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ දන්වා සිටියහ: "සැබැවින්ම අල්ලාහ් ඔහුව විශ්වාස කරන, ඔහුගේ නියෝගවලට අවනත වන, ඔහු තහනම් කළ දැයින් වැළකී සිටින ඔහුගේ ගැත්තෙකුට ආදරය කළ විට, ඔහු ජිබ්රීල් අමතා මෙසේ පවසයි:" 'සැබැවින්ම, අල්ලාහ් පුද්ගලයකුට ආදරය කරයි. එබැවින් ඔබ ද ඔහුට ආදරය කරන්න.' එවිට, මලක්වරුන්ගේ ප්රධානී ජිබ්රීල් (අලයිහිස් සලාම්) තුමා ද ඔහුට ආදරය කරයි. පසුව අහස් වාසී මලක්වරුන් කැඳවා ඔවුන් අතර මෙසේ නිවේදනය කර සිටියි: 'සැබවින්ම ඔබේ පරමාධිපතියාණන් පුද්ගලයකුට ආදරය කර ඇත; එබැවින් ඔබ ද ඔහුට ආදරය කරන්න;' එවිට අහස් වාසීහු ඔහුට ආදරය කරති. පසුව පොළොවේ දේවත්වය විශ්වාස කරන මුඃමින්වරුන් අතර පිළිගැනීමට ඔහු ව ලක් කරනු ඇත. ඒ අනුව ඔවුහු ඔහුට ආදරය කරති. ඔහු වෙත නැඹුරු වෙති. එමෙන්ම ඔහු ගැන තෘප්තිමත් වෙති. අල්ලාහ් ගැත්තෙකුට වෛර කරන්නේ නම්, ඔහු ජිබ්රීල් අමතා මෙසේ කියයි: 'සැබැවින්ම මම පුද්ගලයකුට වෛර කරමි, ඔබ ද ඔහුට වෛර කරන්න.' ඒ අනුව ජිබ්රීල් ද ඔහුට වෛර කරනු ඇත. පසුව ජිබ්රීල් අහස් වාසීන් අමතා මෙසේ නිවේදනය කරයි: 'සැබැවින්ම ඔබේ පරමාධිපතියාණන් පුද්ගලයකුට වෛර කර ඇත. එබැවින් ඔබ ද ඔහුට වෛර කරන්න.' එවිට ඔවුහු ද ඔහුට වෛර කරති. පසුව පොළොවෙහි දේවත්වය විශ්වාස කරන අයගේ හදවත් තුළ ඔහුට වෛරය නියම වනු ඇත. ඔවුන් ඔහු සමග කේරා්ධ වෙති, ඔහුව පිළිකුල් කරති.

http://www.sunnah.global/hadeeth/si/show/6458